| | | | |
|---|---|---|---|
| දුරකථන<br>தொலைபேசி<br>Telephones | 011-2136600<br>011-2136650 | මගේ අංකය<br>எனது இல.<br>My No. | PSC/EST/3/3/3/II |
| ලේකම්<br>செயலாளர்<br>Secretary | 011-2136602 | | |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011-2876169<br>011-2876181 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | |
| විද්‍යුත් තැපැල<br>மின்-அஞ்சல்<br>E - mail | info@psc.gov.lk | | |
| වෙබ් අඩවිය<br>இணையத்தளம்<br>Website | www.psc.gov.lk | දිනය<br>திகதி<br>Date | 2025.01. 01 |

**රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය**
**பகிரங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
**OFFICE OF THE PUBLIC SERVICE COMMISSION**

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை.
No. 1200/9, Rajamalwatta Road, Battaramulla.


රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ : 01/2016(II)

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්,

<u>බඳවා ගැනීමේ පටිපාටි හා සේවා ව්‍යවස්ථා සකස් කිරීම සම්බන්ධ උපදෙස් මාලාවේ **7.2.5** වගන්තිය සංශෝධනය කිරීම.</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2016.03.03 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2016 සහ ඊට සංශෝධන වශයෙන් නිකුත් කරන ලද 2016.06.30 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2016(1) කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2016(1) හි විධිවිධාන 2025.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරනු ලැබේ. ඒ අනුව, 2016.03.03 දින නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2016 හි මුල් විධිවිධාන 2025.01.01 දින සිට සිට නැවත බලාත්මක වේ.

03. තවද, දැනට අනුමත කර ඇති සියලුම සේවා ව්‍යවස්ථා සහ බඳවා ගැනීමේ පටිපාටිවල විවෘත බඳවා ගැනීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ ක්‍රමය මෙම චක්‍රලේඛය බලාත්මක වන 2025.01.01 දින සිට 2016.03.03 දිනැති රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2016 හි විධිවිධානයන්ට අනුකූලව මෙයින් සංශෝධනය වී ඇති ලෙස සලකා කටයුතු කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඩබ්.එච්.එම්.එම්.සී.කේ. දයාරත්න

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව